INTRODUCING 1st TIME IN UK

FareDeals Travel & Tours
Fly With Someone You Trust
458, Alexandra Avenue, Rayner's Lane, (Opp:Tube). HA2 9TL. United Kingdom.

- All Deals Available in Colombo Market (In Rupees)
- Cheaper than Leading Agents in Colombo
- We deliver Tickets to your Door Step in Sri Lanka
- No Middlemen, Book Directly With us in London

Fly to Colombo

Srilankan Air	£ 360*
Qatar Air	£ 260*
Kuwait Air	£ 220*
Oman Air	£ 190*
Ethihad Air	£ 350*
Jet Air	£ 280*
Gulf Air	£ 210*

Buy your COLOMBO to LONDON/ UK, Australia, Italy, USA, Tickets. pay in pounds or rupees.

Call Dulip or Sidath
0208 150 3343
0800 612 4045

Fly to London / UK

Srilankan	Rs. 85000*
Qatar	Rs. 62000*
Kuwait	Rs. 56000*
Royal Jor	Rs. 58000*

Special Student Offers (o/way)

Srilankan	Rs. 50000*
Qatar	Rs. 58000*
Kuwait	Rs. 41200*

* Fares subject to taxes/change

Emergency Travel etc Dulip
07551 549 559
info@faredealtravels.co.uk
www.faredealtravels.co.uk

ETIHAD Emirates CATHAY PACIFIC KUWAIT AIRWAYS SrilankanQATAR AIRWAYS

FareDeals Rent-A-Car in Sri Lanka

Book a Car or Van for your Holiday (Self & Chauffeur Driven)

- 3 Day / Weekly / Monthly Rentals
- Low / Competitive Rates
- Breakdown Replacement Available
- Pick from Airport / Our Office
- We can deliver to your doorstep*

*Conditions apply

Call - Dulip or Kasun
for more Details..

0208 150 3343

ලංකාවෙ පැට්‍රෝල්වල වතුර

ශ්‍රීලංකාවේ මේ දිනවල මහා කලබලයකි. වාහන ගමන්කරද්දී ඇන්ජිම ක්‍රියාවිරහිත වී අතරමග නැවතෙන්නට පටන්ගත්තේය. එයට හේතුව තෙල් සංස්ථාවෙන් ගෙන්වා ඇති පැට්‍රල්වල වතුර අඩංගු වී තිබීමයි. මේ නිසා රට පුරා බොහෝ වාහන දුවවන්නට නොහැකි තත්වයකට පත්විය. එම පැට්‍රල් වාහනයකට දැමීමට සුදුසු ඒවා නොවේ.

දස දිගින් චෝදනා සහ හඬනැගීම් එන විට තෙල් පිළිබඳ ඇමතිවරයා වන සුසිල් ප්‍රේමචන්ද්‍ර මහතා මුලින් ප්‍රකාශ කළේ ඒ පැට්‍රල් කිසිසේත් බාල පැට්‍රල් නොවන බවත් වාහන නවතින්නේ පැට්‍රල්වල වරදින් නොවන බවත්ය.

ඊළඟට ඔහු ප්‍රකාශ කළේ පැට්‍රල් ෂෙඩ්වල ඇති පැට්‍රල් ගබඩා ටැංකිවල පතුලේ කුණු හා අප ද්‍රව්‍ය තිබිය හැකි බවත් වාහනයට පැට්‍රල් ගහන විට ඒ පැට්‍රල් සමග ඒ කුණු ඇන්ජිමට යාම හේතුවෙන් වාහන ක්‍රියාවිරහිත විය හැකි බව ය. එසේත් නැත්නම් වැස්සේ ෂෙඩ් එකකින් තෙල් ගහන විට මේ වහින කාලය බැවින් ඊට වැහිවතුර මිශ්‍රවිය හැකි බවයි. මේ කිසිදු පැහැදිලි කිරීමකින් ජනතාව සනසන්නට බැරි විය. ඔවුන් එක හෙලාම කියා සිටියේ රජය දැනුවත්වම වතුර කළවම් කළ පැට්‍රල් රටට ගෙන්වා ඇති බව ය.

මේ අතරම ඇමතිවරයා මාධ්‍ය සාකච්චාවක් කැඳවා තත්වය පැහැදිලි කළේ ය. ඒ මෙසේ ය.

දැනට ලංකාවට ඛනිජ තෙල් සපයන්නේ ඉන්දියානු තෙල් සමාගමකිනි. ළඟදී ඔවුන්ගේ තෙල් සැපයුම අඩුවූ නිසා ලංකාවේ පැට්‍රල්වලට ඇති ඉල්ලුම වැඩි වූයේය. ඒ සමගම ලංකා ඛනිජ තෙල් සංස්ථාව යන්ත්‍ර අළුත් වැඩියාකිරීමේ කට යුතු සඳහා දින අටක් වසා තබන්නට සිදුවීය. මේ සියල්ල නිසා රට තුළ ඉන්ධන ඉල්ලුම වැඩිවෙද්දී එය පිරිමහන්නට රජය වැඩිපුර තෙල් ප්‍රමාණයක් ඉන්දියාවෙන් ඉල්ලා සිටිවිට ඔවුන් කලින් ලංකාව ගෙවූ මිළට වඩා වැඩි ගණනක් මේවර ඉල්ලුවේය. ඒනිසා වෙනත් පිටරට සමාගමකින් තෙල් මෙට්‍රික් ටොන් 20,000 ක් රජය ගෙන්වූවා ය. ඒ සඳහා වැයවූ මුදල ඇමරිකානු ඩොලර් මිලියන 11. 5 කි. ලංකා රුපියල් වලින් බිලියන 1.17 කි.

මතභේදයට තුඩුදී ඇති ඉහතකී පැට්‍රල් තොගය ගෙන්වා ඇත්තේ ඩුබායි වල එමිරේට් ජාතික තෙල් සමාගමෙනි. දැනට එම තෙල් සඳහා ගෙවීම් අත්හිටුවා ඇති අතර, ඉහතකී තෙල් බාල වර්ගයක්දැයි සොයාබලන්නට බල ශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළු කමිටුවක් පත්කර ඇති බවද ඇමතිවරයා හෙළි කළේය.

දැනට තත්වය මෙසේ වුවද ඉහතකී පැට්‍රල් නිසා නරක් වූ වාහන ඇන්ජීන් යළි අළුත් වැඩියා කරන්නට රුපියල් ලක්ෂ ගණන් වියදම් වන බව වාහන හිමියෝ කියති.

♥ පැටියො ඩාලිං

"පැටියො.... දන්නවයි වැඩක්.... අන්න රජය ලංකා පොලීසියෙ දැන් තියෙන නිලඇඳුම වෙනස් කරලා අළුත් එකක් දෙන්න යනවා"

" ඒ හාදයො ටික එහෙම කරලාවත් හදල ගන්න පුළුවන්ද බලන්න වෙන්න ඇති.... "

" ඒක හරියට ඔළුවෙ කැක්කුම හැදුනම කොට්ටෙ මාරු කරනවා වගේ වැඩක් .... "

Sam's CHICKEN CHICKEN CHICKEN

Great Tasting! Great Value!

සෑම්ස් චිකන්

17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432

Sinhala Lesson 23 සිංහළ පාඩම

සිංහල ඉගෙනීමට පහසු මගක් !

පහත දැක්වෙන සිංහල අකුරු ශබ්දකරන්නේ ඊට යටින් ඇති ඉංග්‍රීසි වචනයේ ඉරිගසා ඇති කොටස හඬ නැගෙන විධියට බව දරුවන්ට කියා දෙන්න.

The sound of each Sinhala letter corresponds to the underlined part of the English word. Now read aloud the Sinhala letter.

Vowel Strokes

ා ැ ෑ ි ී ු ූ ෙ ේ ො ෝ ෞ

ඹ	ඹා	ඹැ	ඹෑ
amber	simba	dimbat	gumbad
ඹි	ඹී	ඹු	ඹූ
Bambi	humbee	Rambuka	bamboo
ඹෙ	ඹේ	ඹො	ඹෝ
rumbet	rumbay	somebody	Jumbo

♦ ආචාර්ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

හරස්පද ප්‍රහේලිකා 130



හරහට :
1 සියලු
5 වාදන භාණ්ඩයකි
6 කෙනෙකුට අයත් වස්තුව
8 විසිපහට පහල ගණනක්
9 දහවලට නොවේ
10 කෝපවූ විට මෙසේ බලති

පහළට :
1 වැඩි අලංකාරයක් නැති
2 ඇස්වල ඇත
3 මොව්හු ලංකාව යටත්කර ගත්හ
4 කුකුළාගේ නාදය මෙසේ හැඳින්වේ
7 හීන් ලී කැබැල්ල 8 සමහරුන්ගේ කටේ නිතර මෙය තිබේ

ගියවර නිවැරදි විසඳුම්

හරහට : 1 විකාර 5 නසින 6 හවරි 8 වසලයා 9 කැම 10 ගස
පහළට : 1 විනය 2 කාසි 3 රනහස 4 විපිරියාස 7 වලග 8 වම

මැයි මස ප්‍රෙහේලිකාවේ නිවැරදි විසඳුම්

හරහට : 1 මකරා 4 කුර 5 කය 6 නාදය 8 හින්නි 10 ගීය 11 තිත
පහළට : 1 මකුනා 2 කරදහිය 3 සියලු 7 විපිරියාස 9 නිත

නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

වම්බටු සම්බෝලය
Aubergine Sambol

අවශ්‍ය ද්‍රව්‍ය :

ලොකු වම්බටු ගෙඩි	2 ක්
තක්කාලි ගෙඩි	2 ක්
රතුළුණු ගෙඩි	8 ක්
අමුමිරිස් කරල්	3 ක්
අඹරාගත් අබ තේ හැඳි	1 ක්
උම්බලකඩ කුඩු ටිකක්	
ලුණු හා දෙහි ඇඹුල් අවශ්‍ය පමණ	

සාදන ක්‍රමය : මුලින්ම වම්බටු ගෙඩි දෙක උණු ජලයට දමා තම්බාගෙන පොතුහැර කුඩා කැබලිවලට කපාගන්න. අමුමිරිස් සහ රතුළුණු සිහිනියට ලියාගන්න. තක්කාලි කුඩා කැබලිවලට කපාගන්න. වම්බටු සහ අනෙක් සියළු කළමනා භාජනයකට දමා කළවම් කරන්න. දැන් ඊට අබ ලුණු සහ දෙහි ඇඹුල් දමා ඒ සියල්ල යළිත් මනාසේ කළවම් කරගන්න.

♦ ***කාන්ති ද තාබඤ රත්ගම*** Sri Lanka